සැ. යු. - 2015.03.13 වැනි දින පළ වූ අංක 1906 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,907 - 2015 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2015.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 134 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 134 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 135 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 150 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය.* **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2015 අප්‍රේල් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

133 – B 080930—302 (2015/03)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 70

DIVF/RECT/85/AY(1).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා - ස්වේච්ඡා බල සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම් හා ඇතුළත් කිරීම්

**අධිකාරියට පත්කිරීම හා ඇතුළත් කිරීම**

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරින්/කාන්තා කෙඩෙට් නිලධාරිණියන් නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාව වෙත ඉදුරාම බඳවාගෙන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

කෙඩෙට් නිලධාරි පෝරඹ චමින්ද කුමාර ලියනගේ, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි හලාවත් මුදියන්සේලාගේ ටානියා ගුණරත්න, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි සංඛිනි එරන්දි ද සිල්වා, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි දිද්දෙනි ගමගේ උදේනි දිද්දෙනිය, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි අලෙත්තුගේ චතුරානි තුෂාරා ඇන්තනි, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි කිරිහෙට්ටිගේ දොන ශ්‍රීමාලි ප්‍රදීපිකා කිරිහෙට්ටි, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි කේෂානි ගයාංගි විජේසූරිය, 2013.03.07
කෙඩෙට් නිලධාරි සහන් ටිකිරි ජයසිංහ, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි අත්තුඩාවේ ලියන ආරච්චිගේ ශානිකා දිල්හානි ලියනආරච්චි, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි රන්දාරා සුහසිනි කෞශල්‍යා ගුණතිලක, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි මාරසිංහගේ විමර්ෂණී නදීෂා කරුණාරත්න, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි ජෝසප්ගේ අශානි ඩැෂ්රානි නවරත්න, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි නිසංසලා දළදාවත්ත, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි පටුවත විතානගේ ජීවනී මධුෂා කාරියවසම්, 2013.03.07
කාන්තා කෙඩෙට් නිලධාරි හෙට්ටිආරච්චිගේ ශෙරණි ඉනෝෂිකා ජයසේකර, 2013.03.25
කෙඩෙට් නිලධාරි නවගමුවේ ලොකුපතිරණගේ කාංචන ලක්මාල් ජයතිලක, 2013.06.25
කෙඩෙට් නිලධාරි හේවගේ රවීන්ද්‍රනාත් තරංග, 2013.06.25
කෙඩෙට් නිලධාරි රාමනායකගේ චානක චතුරංග පෙරේරා, 2013.06.25
කෙඩෙට් නිලධාරි හේවාවසම් පතිරාජගේ නිශාන්ත පතිරාජ, 2013.06.26
කෙඩෙට් නිලධාරි පල්ලේ කොටුවේ අමිල සඳරුවන් අමරසිංහ, 2013.06.26
කෙඩෙට් නිලධාරි දොඹගහගෙදර අනුරාධ දේශප්‍රිය රූපසිංහ, 2013.07.25

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි 24 වැනි දින,
කොළඹ දී ය.

03-499

# රජයේ නිවේදන

*මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/13/2015/පිටු/සැ.*

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.03.20 වැනි දින සිට 2015.04.03 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.04.10 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ජී දරන කොට්ඨාසයේ 169 වෙළුමේ 112 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, තලවතුගොඩ පිහිටි "ගොරකගහවත්ත' නමැති ඉඩමේ ඕ අක්ෂරය දරන කැබැල්ලට බලයලත් මානක එම්. බී. ද සිල්වා විසින් 1930.06.04 දින මැන සාදන ලද අංක 2115 පිඹුර ප්‍රකාර මායිම්,<br>*උතුර* : බස්තියන්ට බෙදා වෙන්කළ එම ඉඩමේ සී අක්ෂරය දරන කොටස<br>*නැගෙනහිර* : සාමෙල් පෙරේරාට සහ ඒබ්‍රහම් පීරිස්ට අයිති ඉඩම්<br>*දකුණ* : ගාබ්‍රියෙල් පෙරේරාට සහ තවත් අයට අයිති ඉඩම්<br>*බටහිර* : පාරකට ඉතිරිකළ බිම් තීරය<br>ප්‍රමාණය : අ. 01, රූ. 01, පර්. 11 | 01. එච්. ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1958.11.07 දින ලියා සහතික කරන ලද අංක 7386 දරන විකුණුම් ඔප්පුව<br><br>02. එල්. පණ්ඩිතරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1974.12.22 දින ලියා සහතික කරන ලද අංක 3164 දරන තෑගි ඔප්පුව |

03-572

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය**

කොළඹ විශ්වවිද්‍යාලය

**2012 දෙසැම්බර් මස 31 වැනි දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය**

| *වත්කම්* | *2012*<br>*රු.* | *2011*<br>*රු.* |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| **දේපළ, පිරියත සහ උපකරණ** | | |
| ගොඩනැගිලි | 12,643,800 | 13,609,495 |
| විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 60,601,400 | 63,508,994 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 990,690 | 882,382 |
| මෝටර් වාහන | 3,774,644 | 5,015,623 |
| එකතුව | 78,010,534 | 83,016,494 |
| ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම් | 30,413,602 | 31,309,842 |
| ඉදිකිරීම් නොනිමි වැඩ | 37,748,579 | 15,420,756 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 2,442,445 | 2,588,631 |
| ලැබිය යුතු මුදල් සහ කලින් ගෙවීම් | 38,602,043 | 33,202,229 |
| SIDA අරමුදල් | - | 60,429,110 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 581,177,143 | 482,533,173 |
| මුළු ජංගම වත්කම් | 622,221,631 | 578,753,143 |
| මුළු වත්කම් | 768,394,353 | 708,500,240 |

| වත්කම් | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **හිමිකම් සහ වගකීම්** | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | |
| **ප්‍රාග්ධනය** | | |
| ප්‍රාග්ධන ප්‍රධාන - වැය නොකළ | 4,857,245 | 3,361,251 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය කළ | 57,564,972 | 39,984,898 |
| විදේශ ආධාරලත් ව්‍යාපෘති - වැය නොකළ | 1,336,470 | 7,823,342 |
| විදේශ ආධාරලත් ව්‍යාපෘති - වැය කළ | 30,803,032 | 11,684,294 |
| විලම්බිත ප්‍රදාන | - | 37,430,874 |
| UoC වෙතින් දායකත්වය | 8,155,714 | 8,155,714 |
| එකතුව | 102,717,433 | 108,440,373 |
| සංචිත | 433,117,827 | 342,298,905 |
| සීමාකළ අරමුදල් | 67,859,485 | 54,954,738 |
| **ජංගම නොවන වගකීම්** | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | 27,573,818 | 23,393,238 |
| **ජංගම වගකීම්** | | |
| වෙනත් උපචිත වියදම් සහ ගෙවිය යුතු මුදල් | 137,051,170 | 117,960,098 |
| SIDA අරමුදල් | - | 60,429,110 |
| බැංකු අයිරා | 74,620 | 1,023,778 |
| එකතුව | 137, 125,790 | 179,412,986 |
| මුළු හිමිකම් සහ වගකීම් | 768,394,353 | 708,500,240 |

28.02.2013

අධ්‍යක්ෂ (UCSC) ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී.

**2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් සහ වියදම් ගිණුම**

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **උපාධි අපේක්ෂක වැඩසටහන** | | |
| **ආදායම** | - | - |
| රාජ්‍ය ප්‍රදාන | 91,802,000 | 83,102,728 |
| විලම්බිත ආදායම් - ප්‍රදාන | 14,629,135 | 19,778,039 |
| වෙනත් | 2,671,894 | 4,879,143 |
| | 109,103,029 | 107,759,910 |
| **උපාධි අපේක්ෂක වැඩසටහන - වියදම** | - | - |
| පුද්ගල සංවේතන | 60,733,791 | 50,717,167 |
| ගමන් වියදම් | 37,701 | 387,447 |
| සැපයුම් | 2,927,786 | 2,424,562 |
| ගිවිසුම් ගත සේවාවන් | 26,818,704 | 24,159,062 |
| විශ්‍රාම ප්‍රතිලාභ | 13,726,350 | 8,133,475 |
| දායක මුදල්, දායකත්ව සහ සාමාජික ගාස්තු | 36,929 | 44,139 |
| සේවක සංවර්ධනය | 106,270 | 349,643 |

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| වෙනත් පුනරාවර්තන වියදම් | 6,825,057 | 6,094,293 |
| ක්ෂය | 14,629.135 | 18,551,317 |
| එකතුව | 125,841,723 | 110,861,105 |
| උපාධි අපේක්ෂක වැඩසටහන්වලින් හිඟය | (16,738,694) | (3,101,195) |
| **ව්‍යාප්ති වැඩසටහන** | | |
| දර්ශනපති වැඩසටහන | 41,891,163 | 30,760,124 |
| බාහිර උපාධි මධ්‍යස්ථානය | 40,714,205 | 43,468,371 |
| පරිගණක සේවා මධ්‍යස්ථානය | 2,137,334 | 654,128 |
| උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය | 827,464 | 175,248 |
| ඉ ඉගෙනුම් මධ්‍යස්ථානය | 18,105,244 | 1.972,517 |
| වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | (520,064) | (461,413) |
| ව්‍යාප්ති වැඩසටහනින් අතිරික්තය | 103,155,346 | 76,568,975 |
| **ව්‍යාපෘති** | | |
| විදේශ ආධාරලත් පොදු ව්‍යාපෘති | - | - |
| | 10,792,226 | - |
| ICTer සම්මන්ත්‍රණය - 2012 | 147,339 | - |
| IDRC අතථ්‍ය ග්‍රාමය | 95,992 | 65,944 |
| ව්‍යාපෘතිවලින් අතිරික්තය | 11,035,557 | 65,944 |
| ශුද්ධ අතිරික්ත (හිඟය) | 97,452,209 | 73,533,724 |

**2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහන ප්‍රකාශය**

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂය සඳහා හිඟය/අතිරික්තය | 97,452,209 | 73,533,724 |
| **පහත දේ සඳහා ගැළපුම්** | | |
| ක්ෂය | 25,210,600 | 25,380,877 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 4,407,740 | 3,233,192 |
| ක්ෂය අධි වෙන් කිරීම් | 0 | (67,655) |
| විලම්බිත ආදායම් | (22,142,464) | (23,974,726) |
| ලද පූර්ව ප්‍රදානවලින් මාරු කිරීම | (10,901,365) | (5,245,357) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | (96,450) | (1,283,000) |
| විනිමය ආදායම | (11,616,474) | (784,747) |
| කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 82,313,796 | 70,792,308 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් | 9,792,438 | 8,070,977 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කළ ශුද්ධ මුදල් | 92,160,234 | 78,863,285 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (16,146,779) | (28,430,366) |
| ඉදිකිරීම් මත කළ ගෙවීම් | (22,327,823) | - |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලත් මුදල | 96,450 | 1,283,000 |
| පුනරුත්තාපන සහ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු | (1,905,331) | (561,288) |
| | 51,822,751 | 51,154,631 |

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **uq,H l%shdldrlïj,ska uqo,a m%jdy** | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන | 19,150,000 | 18,205,340 |
| ලද ව්‍යාපෘති ප්‍රදාන | 5,639,052 | 6,202,608 |
| සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ශේෂයන් මාරු කිරීම | (2,503,889) | (5,805,939) |
| NeIC ව්‍යාපෘති මාරු කිරීම | - | (379,400) |
| ICTer සම්මන්ත්‍රණය | 1,191,152 | - |
| ගෙවූ පාරිතෝෂික | (227,160) | (73,688) |
| සීමිත අරමුදල් වලින් ලැබීම් | 12,904,748 | 12,093,420 |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 87,976,654 | 81,396,972 |
| විනිමය ආදායම/(පාඩුව) | 11,616,474 | 784,747 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 481,509,396 | 399,327,677 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 581,102,523 | 481,509,396 |

**මූල්‍ය ඉස්මතු කිරීම**

රුපි. 000

| *මුදල් වර්ෂය* | *2012* | *2011* | *2010* | *2009* | *2008* | *2007* | *2006* |
|---|---|---|---|---|---|---|---|
| **ශේෂ පත්‍රය** | | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 581,177 | 481,510 | 401,220 | 327,808 | 260,935 | 201,245 | 164,656 |
| ලැබිය යුතු මුදල් සහ කලින් ගෙවීම් | 38,602 | 33,202 | 35,580 | 34,859 | 32,253 | 19,219 | 13,058 |
| තොග | 2,442 | 2,588 | 3,251 | 2,404 | 2,126 | 1,548 | 1,859 |
| UCSC විසින් කළමනාකරණය කළ SIDA අරමුදල් | - | 60,429 | 222,763 | 186,424 | 77,020 | 81,555 | 86,432 |
| UCSC විසින් කළමනාකරණය කළ LEARN අරමුදල් | - | - | 51,256 | 74,896 | 49,024 | 61,861 | 27,695 |
| ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම් | 30,413 | 31,309 | 34,381 | 21,694 | 20,455 | 18,918 | 16,231 |
| ඉදිකිරීම් නොනිමි වැඩ | 37,749 | 15,420 | - | - | - | - | - |
| දේපළ පිරියත සහ උපකරණ | 78,011 | 83,016 | 81,261 | 75,535 | 83,684 | 88,079 | 115,581 |
| මුළු වත්කම් | 768,394 | 707,474 | 829,712 | 723,620 | 525,497 | 472,425 | 425,512 |
| ප්‍රාග්ධනය | 102,717 | 108,440 | 105,296 | 108,690 | 109,000 | 102,707 | 124,218 |
| සංචිත | 433,118 | 342,299 | 272,126 | 232,899 | 179,578 | 138,765 | 109,647 |
| සීමාකළ මුදල් | 67,859 | 54,954 | 43,215 | 30,110 | 22,528 | 19,597 | 18,457 |
| වෙනත් වගකීම් | 164,700 | 201,381 | 409,075 | 351,921 | 214,381 | 211,356 | 173,190 |
| මුළු වගකීම් අරමුදල් | 768,394 | 707,474 | 829,712 | 723,620 | 525,497 | 472,425 | 425,512 |
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 91,802 | 83,102 | 65,381 | 68,610 | 71,555 | 78,695 | 52,850 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 19,150 | 16,000 | 4,920 | 4,167 | 11,055 | 10,560 | 36,740 |
| ලද මුළු රාජ්‍ය ප්‍රදාන | 110,952 | 99,102 | 70,301 | 72,777 | 82,610 | 89,255 | 89,500 |
| පුනරාවර්තන වියදම්/වැඩ සටහන | 111,212 | 92,310 | 80,120 | 84,461 | 80,083 | 76,564 | 65,617 |
| ප්‍රාග්ධන වියදම් | 31178 | 28,628 | 21,301 | 8,542 | 12,764 | 12,305 | 29,064 |
| මුළු වියදම්/වැඩසටහන | 142,390 | 120,938 | 101,421 | 93,003 | 92,847 | 88,869 | 94,681 |

රුපි. 000

| *මුදල් වර්ෂය* | *2012* | *2011* | *2010* | *2009* | *2008* | *2007* | *2006* |
|---|---|---|---|---|---|---|---|
| උත්පාදනය කළ ආදායමෙන් දායකත්වය | 31,438 | 21,836 | 31,120 | 20,226 | 10,237 | - | 5,091 |
| උත්පාදනය කළ ආදායමෙන් දායකත්වය % | 16% | 14% | 25% | 17% | 10% | 0% | 9% |
| උත්පාදනය කළ ශුද්ධ ආදායමෙන් දායකත්වය % | 28% | 28% | 62% | 35% | 18% | 0% | 21% |
| උත්පාදිත ආදායම | 194,230 | 159,429 | 123,267 | 115,690 | 105,426 | 68,494 | 58,981 |
| පුනරාවර්තන වියදම ව්‍යාප්ති වැඩසටහන් | 82,390 | 80,197 | 73,313 | 58,399 | 47,316 | 40,117 | 35,141 |
| විදේශ අරමුදල් සම්පාදනය කළ ව්‍යාපෘති සඳහා ලද ප්‍රදාන | 5,639 | 6,202 | 93,581 | 104,834 | 70,969 | 35,700 | 46,356 |
| අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව | 737 | 737 | 739 | 749 | 754 | 584 | 592 |
| සේවක සංඛ්‍යාව | 144 | 144 | 151 | 162 | 156 | 147 | 139 |
| ශිෂ්‍යකුගේ පිරිවැය වර්ෂයක ('000) | 151 | 125 | 108 | 113 | 106 | 131 | 111 |
| සේවකයකුගේ පිරිවැය වර්ෂයකට ('000) | 670 | 578 | 457 | 414 | 384 | 372 | 359 |

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය.

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ පරිගණක අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පරිගණක අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තරාත්මක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්ව විද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2013 ජූලි 23 දින නිකුත් කරන ලදී.

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 *විගණකගේ වගකීම*

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරන ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම් මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 *තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්තවාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන :**

2.1 *තත්ත්වාගණනය කළ මතය*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2012 දෙසැම්බර් මස 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1 *ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම*

පරිගණක අධ්‍යයන ආයතනය තීක්ෂණ නමින් ඇපයෙන් සීමිත සමාගමක් පිහිටුවා තිබුණු අතර, එහි කළමනාකරණ මණ්ඩලයේ සියයට 80ක ප්‍රමාණයක් පරිගණක අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වන අතර, එම ඇපයෙන් සීමිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කර ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මෙම තීක්ෂණ සමාගම සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.

2.2.2 *ගිණුම්කරණ අඩුපාඩු*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර පොත් අගය ශුන්‍ය වූ සහ පිරිවැය රු. 2,775,000ක් වූ භාවිතයේ පවතින වෑන් රථය ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් වෙනත් ආයතන සමග ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති නමයක අතිරික්ත මුදල් රු. 41,336,035ක් ආදායමට ගැනීම වෙනුවට ජංගම වගකීම් ලෙස වසර කිහිපයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව උපචිත පදනමට ගිණුම් සකස් කර ඇති බව දක්වා ඇතත්, නේවාසිකාගාර කුළී ආදායම මුදල් පදනම මත ගිණුම් ගත කිරීම හේතුවෙන් නේවාසිකාගාර කුළී ආදායම රු. 35,933ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ආයතනය විසින් 2006 මාර්තු මස 31 දිනැති 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 37(2)(ආ) වගන්තිය අනුව, ස්ථාවර තැන්පත් පොළියෙන් ඒ ඒ වර්ෂවල අවකරණය කරන ලද එකතුව රු. 3,568,155ක් වූ රඳවා ගැනීමේ බදු මුදල් වියදම් වශයෙන් ගිණුම් ගත කිරීමෙන් තොරව ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.3 *ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන්*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු. 471,048ක් වූ ලැබිය යුතු ශේෂයක් හා එකතුව රු. 4,800,790ක් වූ ගෙවිය යුතු ශේෂ වර්ෂ 1 සිට 8 ක කාල පරාසයක දී නිරවුල් වී නොතිබුණි.

2.2.4 *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම*

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය :

| *නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) *ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි* | |
| (i) මුදල් රෙගුලාසි 394(අ) | 2010 වර්ෂයේ සිට ජංගම වගකීම් ලෙස දැක්වෙන රු. 75,878ක් වටිනා අවලංගු කළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (i) මුදල් රෙගුලාසි 756 හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXVI වැනි පරිච්ඡේදයේ 2 උපවගන්තියේ 2.1 | ආයතනයේ පවතින සියලුම ජංගම නොවන වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වුවත් පිරිවැය රු. 465,902,528ක් වටිනා ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2013 අගෝස්තු 23 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| *නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම* |
| --- | --- |
| (ආ) 2011 අප්‍රේල් මස 04 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 4(අ) උපඡේදය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2011 ජනවාරි 20 දිනැති 2011/01 | පර්යේෂණ දීමනාවට හිමිකම් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් පර්යේෂණ කළමනාකරණය සඳහා වූ කමිටුව වෙතින් පර්යේෂණ යෝජනාව සඳහා අනුමැතිය ගතයුතු වුවද, ඒ වෙනුවට කළමනාකරණ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය ලබාගෙන තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 25ක් වෙත සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ දී රු. 2,060,529ක දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) 2002 අංක 01 දරන පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 13 වගන්තියේ 2(1)(ආ) | පර්යේෂණ දීමනාව අඛණ්ඩව ලබාගැනීම සඳහා පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ කමිටුව විසින් සෑහීමකට පත්විය යුතු බවත්, ආචාර්යවරු 07 දෙනෙක් සඳහා ගෙවූ රු. 557,175ක පරීක්ෂණ දීමනා සඳහා පර්යේෂණ ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහිමකට පත්වී නොතිබුණි. |
| (ඈ) 2009 ජුනි 03 දිනැති අංක යූජීසී/ජේයූඒ/2/පීජීඑස්/6 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය. | විශ්ව විද්‍යාල පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන කථිකාචාර්ය වරුන් වෙනුවෙන් පැයකට රු. 2,500ක් බැගින් ගෙවිය යුතු වුවත්, 2012 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා දේශන පැයකට රු. 3,000ත් රු. 4,000ත් බැගින් එකතුව රු. 2,840,250ක මුදලක් ගෙවා තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 *මූල්‍ය ප්‍රතිඵලය*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවලට ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 5,650,218ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 9,569,010ක් විය. පුවරාවර්තන වියදම් සඳහා රු. 91,802,000ක් වූ රජයේ ප්‍රදාන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 97,452,218ක් දක්වා වර්ධනය වී ඇත. ඉකුත් වර්ෂයේ දී රු. 83,102,728ක් වූ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන හේතුවෙන් ඌනතාවය රු. 73,533,724ක අතිරික්තයක් බවට පත් විය. සමාලෝචිත වර්ෂයේ රු. 23,918,500ක වර්ධනයක් ඇතිවීම සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු. 8,699,272කින් වැඩිවීම හා ආදායම රු. 31,579,250කින් වර්ධනයවීම බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 *කළමනාකරණ අකාර්යක්ෂමතා*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) පරිවාස කථිකාචාර්යවරයෙකු 2005 දෙසැම්බර් 31 දින සේවය හැර ගොස් තිබුණු අතර, බැඳුම්කර වටිනාකම රු. 798,589ක් ආයතනට අයවීමට තිබුණි. 2006 නොවැම්බර් 16 දින සිට අවස්ථා 03 ක දී නීතිපතිවරයා විසින් තොරතුරු විමසා ඇතත් එම තොරතුරු නොසැපයීම හේතුවෙන් නීතිමය කටයුතු අඩාල වී තිබුණි. මෙ මුදල් සේවක අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) කථිකාචාර්යවරයෙකු 2004 ඔක්තෝබර් 01 දින සේවය හැර ගොස් තිබුණ අතර, අය විය යුතු බැඳුම්කර වටිනාකම රු. 1,311,691 ක් විය. 2006 ඔක්තෝබර් මස 10 දිනැතිව මෙම බැඳුම්කර වටිනාකම ගෙවන ලෙස ආචාර්යවරයාට දැනුම් දී ඇතත් පරීක්ෂණ දිනය වන විටත් අදාළ ගෙවීම් සිදු කර නොතිබුණ අතර ආචාර්යවරයාට එරෙහිව නීතිමය පියවර ගැනීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) ආචාර්යවරයෙකු 2004 නොවැම්බර් 01 දින සේවය හැර ගොස් තිබුණු අතර අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 3,440,576ක් විය. ආචාර්යවරයාගේ වර්තමාන ලිපිනය සොයාගැනීමට නොහැකි වීම හේතුවෙන් නීතිමය පියවර ගැනීම සඳහා 2005 අගෝස්තු 31 නීතිපතිවරයා වෙත යොමු කර ඇතත්, වසර 8ක් ගතවී තිබුණු නමුත්, ආයතනය විසින් නීතිපතිවරයාගෙන් විමසීමක් ද කර නොතිබුණි.

(ඈ) කථිකාචාර්යවරයෙකු 2004 ජනවාරි 01 දින සේවය හැර ගොස් තිබුණු අතර අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 3,373,722ක් විය. බැඳුම්කර කඩ කිරීමෙන් වසර 2 1/2කට පසුව, එනම් 2006 මැයි 22 දින ආයතනයට අයවිය යුතු බැඳුම්කර මුදල් ගෙවන ලෙස ආචාර්යවරයාට දැනුම් දී තිබුණ ද, බැඳුම්කර මුදල් අය වී නොතිබුණි. කොළඹ දිසා අධිකරණයේ පවරන ලද නඩුව සමතයකට පත්ව ආචාර්යවරයාගෙන් අයවිය යුතු මුදල 2013 සැප්තැම්බර් 22 දින රු. 2,000,000ක් හා 2014 මාර්තු 22 දින රු. 1,370,772ක් ගෙවීමට එකඟ වූ බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා එවා තිබුණි.

4.2 *අරමුදල් ඌන උපයෝජනය*

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා රජය විසින් ජපන් සහයෝගීතා අරමුදල්වලින් උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (Advance Digital Media Technology Centre) හා ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ව්‍යාපෘතිය (International Development Research Project) වෙත ලබා දී තිබූ රු. 4,197,538ක අරමුදල් වසර තුනකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබාගෙන තිබුණි.

5. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

5.1 *සංයුක්ත සැලැස්ම*

රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 උපඡේදය ප්‍රකාරව, 2011-2015 කාල පරිච්ඡේදයට පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මේ, ආයතනයේ වත්කම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්, ආයතන සතු ශක්තීන්, පරමාර්ථ හා ඒවා සම්බන්ධයෙන් පවතින් දුර්වලතා හා බාධාවන් විශ්ලේෂණාත්මකව හඳුනාගැනීම සඳහා සකස් කළ (SWOT Analysis) ප්‍රකාශනයක් හා ආසන්න වර්ෂ තුන සඳහා මෙහෙයුම් ප්‍රථිපල සමාලෝචනයක් දක්වා නොතිබුණි.

5.2 *ක්‍රියාකාරී සැලැස්ම*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ, ඒ ඒ කාර්යය සඳහා වූ කාල රාමුව, අපේක්ෂිත අරමුණු හා වගකීම දරනු ලබන පුද්ගලයින් වෙනම හඳුනාගත හැකිවන පරිදි ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු. 5,500,000ක ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ආයතනයේ 2011 වාර්ෂික වාර්තාව 2013 ජූලි 23 දින වන විටත් සභාගත කර නොතිබුණි. එම වාර්තාව 2013 පෙබරවාරි 14 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

5.4 පරිගණක අධ්‍යයන ආයතන තුළ සීමිත සමාගමක් පිහිටුවීම

පරිගණක අධ්‍යයන ආයතනය පිහිටවූ 2002 අංක 1 දරන කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 18(iv) වගන්තිය අනුව පරිගණක මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා බලතල පැවරී තිබුණි. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 වගන්තියට අනුකූල නොවන පරිදි එයට පරිගණක අධ්‍යයන ආයතනයේ නියමාවලියේ දක්වා ඇති සමාන අරමුණු හා කාර්යයන් ඉටුකිරීම සඳහා පරිගණක සේවා මධ්‍යස්ථානයට සෘජුවම තරඟකාරී ස්වරූපයක් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව කළයුතු වුවත්, කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි සමාගම් ආඥාපනත යටතේ සීමාසහිත තීක්ෂණ පෞද්ගලික සමාගමක් පිහිටුවීම නීතියට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු ය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම් තැබීම
(ඇ) ව්‍යාපෘති අරමුදල්
(ඈ) මිලදී ගැනීම්

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න,
*වැඩබලන විගණකාධිපති.*

2013 දෙසැම්බර් මස 31 වැනි දින,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත පරිගණක අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වැනි වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක

108(i) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු-

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

1.3 *විගණකගේ වගකීම*

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද, යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 වැනි දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

*පිළිතුරු*

සටහන් කර ගතිමි.

2.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම

පරිගණක අධ්‍යයන ආයතනය තීක්ෂණ නමින් ඇපයෙන් සීමිත සමාගමක් පිහිටුවා තිබුණු අතර, එහි කළමනාකරණ මණ්ඩලයේ සියයට 80ක ප්‍රමාණයක් පරිගණක අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වන අතර, එම ඇපයෙන් සීමිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකබද්ධ ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මෙම තීක්ෂණ සමාගම සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.

*පිළිතුරු*

2013 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී තීක්ෂණ සමාගමේ ගිණුම්ද ඇතුළත් ඒකාබද්ධ ගිණුම් පිළියෙළ කිරීමට කටයුතු කරමි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය පොත් අගය ශූන්‍ය වූ සහ පිරිවැය රු. 2,775,000ක් වූ භාවිතයේ පවතින වෑන් රථය ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

*පිළිතුරු*

WPGF 5434 දරන රු. 2,775,000ක පිරිවැයක් වූ වැන් රථයේ පොත් අගය ශූන්‍ය බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ප්‍රත්‍යාගණනය කර 2013 වර්ෂයේ ගිණුම්වලට ප්‍රත්‍යාගණන අගයන් ගැනීමට කටයුතු කරමි.

(*ආ*) ආයතනය විසින් වෙනත් ආයතන සමග ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති නවයක අතිරික්ත මුදල් රු. 41,336,035ක් ආදායමට ගැනීම වෙනුවට ජංගම වගකීම ලෙස වසර කිහිපයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි.

*පිළිතුරු*

ජංගම වගකීම් ලෙස දක්වා ඇති ව්‍යාපෘති අරමුදල් සහ ඊට අදාළ පිළිතුරු පහත දැක් වේ.

| *ව්‍යාපෘතිය* | *2012.12.31 දිනට ශේෂය* | *ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය* | *අනුගමනය කරනු ලබන පියවර* |
|---|---|---|---|
| I. SIDA Phd, Networking projects | 32,133,791 | ව්‍යාපෘති අවසාන වර්තාව ලබා දී ඇති අතර SIDA ආයතනයේ විගණකවරු, අවසන් විගණනය නිම කර අවසාන වාර්තාව 2013.10.11 දිනයේ නිකුත් කර ඇත. | අවසාන විගණන වාර්තාව සඳහා නිර්දේශ SIDA ආයතනයෙන් ලැබූ පසු ඉතිරි මුදල් සඳහා ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ මත කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවශ්‍ය කටයුතු කරමි. |
| 2. Asia @ Bit | 1,298,615 | ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර, ඉතිරි මුදල් මෙලෙස දක්වා ඇත | අදාළ ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශය මත කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් අදාළ ඉතිරි මුදල් 2013 වසරේ ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| 3. Pandora | 906,725 | | |
| 4. VET | 226,649 | | |
| 5. GIS Project | 1,518,739 | | |
| 6. In Country training Programme | 2,625,758 | | |
| 7. JICA | 2,625,758 | මෙය ඉහත සඳහන් අංක 6 In Country training Programme නැවත ඇතුළත් වීමකි. | අදාළ නිවැරදි කිරීම කර විගණන වාර්තාව යළි ඉදිරිපත් කිරීමට විගණකවරු එකඟ වී ඇත. |
| | 41,336,035 | | |

(*ඇ*) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව උපචිත පදනමට ගිණුම් සකස් කර ඇති බව දක්වා ඇතත්, නේවාසිකාගාර කුලී ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කිරීම හේතුවෙන් නේවාසිකාගාර කුලී ආදායමට රු. 35,933ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට දක්වා තිබුණි.

*පිළිතුරු*

ශිෂ්‍යයන් සඳහා අධ්‍යයන වර්ෂය 2011 ඔක්තෝබර් මස ආරම්භ වූ අතර, ආරම්භයේ ඔවුන්ගෙන් ලැබූ ආදායම 2011 වර්ෂයේ ආදායම ලෙස ගෙන තිබූ අතර, 2012 වසර අවසානයේ දී විශ්වවිද්‍යාලයේ පැවති අර්බුදකාරී තත්ත්වය මත ඊළඟ අධ්‍යයන වර්ෂය ආරම්භය 2012 වසර තුළ සිදු නොවීම නිසා 2012 නේවාසික ගාස්තු ආදායම අඩු වී ඇත.

(*ඈ*) ආයතනය විසින් 2006 මාර්තු 31 දිනැති 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 37(2) වගන්තිය අනුව, ස්ථාවර තැන්පත් පොලියෙන් ඒ ඒ වර්ෂවල අවකරණය කරන ලද එකතුව රු. 3,568,155ක් වූ රඳවා ගැනීමේ බදු මුදල් වියදම් වශයෙන් ගිණුම්ගත කිරීමෙන් තොරව ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබිණි.

*පිළිතුරු*

අදාළ රඳවාගත් බදු මුදල් වියදම් ලෙස 2013 වසර තුළ ලියා හැරීමට කටයුතු කරමි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු. 471,048ක් වූ ලැබිය යුතු ශේෂයක් හා එකතුව රු. 4,800,790ක් වූ ගෙවිය යුතු ශේෂ වර්ෂ 1 සිට 8ක කාල පරාසයකදී නිරවුල්ව නොතිබුණි.

*පිළිතුරු*

ලැබිය යුතු ශේෂ

| *ගිණුමේ නම* | *මුදල* | *අපගේ පිළිතුරු* |
|---|---|---|
| ලැබිය යුතු රැඳවුම් බදු | 242,104 | වියදමක් ලෙස ලියාහැරීමට කටයුතු කරමි. |
| සේවක ආපදා ණය | 271,584 | අදාළ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති අතර එමගින් අය කර ගැනීමට කටයුතු යොදා ඇත. |
| කාර්ය මණ්ඩල ණය | 11,360 | |
| | 471,048 | |

ගෙවිය යුතු ශේෂ

| *ගිණුමේ නම* | *ශේෂය* | |
|---|---|---|
| 1. දේශීය පුහුණු වැඩසටහන | 2,625,758 | කළමනාකරණ මණ්ඩලයේ අනුමතිය ඇතිව ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| 2. ගෙවිය යුතු පාඨමාලා ගාස්තු | 120,000 | |
| 3. Stipend Payable | 30,000 | |
| 4. පාඨමාලා ගාස්තු | 1,623,500 | |
| 5. Amalgamated Club | 27,351 | අදාළ පාර්ශ්වය දැනුවත් කර අදාළ මුදල් ගෙවීමට කටයුතු කරමි. |
| 6. වෛද්‍ය ගාස්තු | 97,101 | |
| 7. ශිෂ්‍ය සංගමය | 53,301 | |
| 8. පී. කේ. එච්. තිලකරත්න | 12,500 | |
| 9. ඊ. හෙට්ටිආරච්චි | 16,667 | |
| 10. රඳවා ගත් මුදල් | 194,612 | |
| | 4,800,790 | |

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම නිරීක්ෂණය විය :-

| *නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 394(අ) | 2010 වර්ෂයේ සිට ජංගම වගකීම් ලෙස දැක්වෙන රු. 75,878ක් වටිනා අවලංගු කළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

*පිළිතුරු*

විදේශ ව්‍යාපෘති අරමුදල් මගින් නිකුත් කළ, එහෙත් ඉදිරිපත් නොකරන ලද චෙක්පත් යටතේ දක්වා ඇත. 2013 වසරේ ආදායමට ගැනීමට කටයුතු කරමි.

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 756 හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXVI වැනි පරිච්ඡේදයේ 2 වන උපවගන්තියේ 2.1 | ආයතනයේ පවතින සියලුම ජංගම නොවන වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වුවත්, පිරිවැය රු. 465,902,538ක් වටිනා ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2013 අගෝස්තු 23 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබිණි. |

*පිළිතුරු*

2012 භාණ්ඩ සමීක්ෂණය වෘත්තීය ආයතනයක් විසින් සිදු කළ අතර, එහි කෙටුම්පත් වාර්තා අප වෙත ලැබී ඇත. අදාළ නිවැරදි කිරීම් සිදු කර අවසාන වාර්තාව ලැබූ වහාම විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ආ) 2011 අප්‍රේල් 04 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛයෙහි 4(අ) උපඡේදය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 201 1 ජනවාරි 20 දිනැති 2011/01

පර්යේෂණ දීමනාවට හිමිකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් පර්යේෂණ කළමනාකරණය සඳහා වූ කමිටුව වෙතින් පර්යේෂණ, යෝජනාව සඳහා අනුමැතිය ගතයුතු වුවද, ඒ වෙනුවට කළමනාකරණ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය ලබාගෙන තිබිණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 25ක් වෙත සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළදී රු. 20,670,529 ක දීමනා ගෙවා තිබිණි.

*පිළිතුරු*

ආයතනයේ ආචාර්ය මණ්ඩලය වෙත පර්යේෂණ දීමනා ගෙවීමට කටයුතු කර ඇත්තේ 2011 අප්‍රේල් මස 20 දින උසස් අධ්‍යාපන චක්‍රලේඛ අංක 1/2011 දරන චක්‍රලේඛය අනුවය. එම චක්‍රලේඛයේ අංක 4(අ) උප ඡේදයේ සඳහන් පරිදි පර්යේෂණ දීමනාවක් ලබාගැනීමට සුදුසුකම් ලබන ආචාර්යවරු විසින් පර්යේෂණ යෝජනාවන් ඉදිරිපත් කිරීමට සනාතන සභාව විසින් පිළිගත් පර්යේෂණ කළමනාකරණ කමිටුව පත් කිරීම සඳහා අප ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව හා කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, අතපසුවීමක් නිසා තරමක් ප්‍රමාද වී සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන ඇත.

(ඇ) 2002 අංක 01 දරන පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 13 වගන්තියේ 2(1)(අ)

පර්යේෂණ දීමනාව අඛණ්ඩව ලබා ගැනීම සඳහා පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ කමිටුවක් විසින් සෑහීමකට පත් විය යුතු වුවත්, ආචාර්යවරු 07 දෙනෙක් සඳහා ගෙවූ රු. 551,175ක දීමනා සඳහා පර්යේෂණ ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහීමකට පත්වී නොතිබිණි.

*පිළිතුරු*

එකී චක්‍රලේඛයේ 03(iii) උපඡේදය අනුව පර්යේෂණ යෝජනා ඉදිරිපත් කළ පසුව මෙම දීමනාව ලබා ගත හැක. ඉදිරි වර්ෂය සඳහා මෙම දීමනාව ලබා ගැනීමේදී මෙම යෝජනාවල ප්‍රගතිය ඇගයීමකට ලක් කරනු ඇත.

(ඈ) 2009 ජූනි 03 දිනැති අංක යූජීසී/ජේයූඒ/2/පීජීඑස්/6 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය

විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන කථිකාචාර්යවරුන් වෙනුවෙන් පැයකට රු. 2,600ක් බැගින් ගෙවිය යුතු වුවත්, 2012 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා දේශන පැයකට රු. 3,000ත් 4,000ත් බැගින් එකතුව රු. 2,840,250ක මුදලක් ගෙවා තිබිණි.

*පිළිතුරු*

පශ්චාත් උපාධි පාඨමාලාව - බාහිර කථිකාචාර්යවරුන් සඳහා ගෙවීම් කිරීම

පරිගණක තාක්ෂණ විද්‍යාව සම්බන්ධයෙන් පවත්වනු ලබන MSc පරිගණක උපාධි අප ආයතනය මෙන්ම වෙනත් විශ්ව විද්‍යාල හා පිළිගත් පෞද්ගලික ආයතනයක් විසින් ද පවත්වනු ලැබේ. මෙම පාඨමාලාව සඳහා තිබෙන ඉල්ලුම තීරණය වන්නේ පාඨමාලාවේ ගුණාත්මකභාවය මතය, පාඨමාලාවේ ඉගැන්වීම් කටයුතු සඳහා අභ්‍යන්තර මෙන්ම බාහිරව ද දේශකයින් බඳවා ගැනීම සිදු කරයි.

පාඨමාලාව සඳහා දේශකයින් පැමිණීම තීරණය වන්නේ ඔවුන්ට ගෙවනු ලබන පැයක දේශන ගාස්තුව මතය. සති අන්තයේදී මෙම පාඨමාලාව සෑම ආයතනයක් විසින්ම පවත්වනු ලබන අතර, ඉහළ දේශන ගාස්තුවක් ගෙවන ආයතන වෙත දේශකයින් පැමිණීමට වැඩි කැමැත්තක් දක්වයි.

අප විසින් ගෙවනු ලබන දේශන ගාස්තුවට, දේශන සඳහා අවශ්‍ය වන මුද්‍රිත සටහන් සකස් කිරීම, මුද්‍රණය කිරීම හා ඒ සම්බන්ධ වෙනත් සියලු මූලික වියදම් ඇතුළත් කොට මෙම "පැයක රේටය" සකස් කර ඇත. එහෙත් අනෙකුත් ආයතන එම කාර්යයන් සඳහා වෙන වෙනම ගෙවීම් සිදු කරනු ලබයි. එනම් LMS භාවිතයෙන් මුද්‍රිත දේශන සටහන් සකස් කිරීම.

මෙම එක් එක් පාඨමාලාවකින් උපයන මුදලින් 60%ක පමණ ප්‍රමාණයක් පාඨමාලාවේ කටයුතු සඳහා වැයවන අතර, ඉතිරි 40% පමණ ප්‍රමාණය, එනම් රුපියල් මිලියන 10ක් පමණ ආයතනයේ අභ්‍යන්තර ශිෂ්‍යයන්ගේ කටයුතු, ආයතනයේ සංවර්ධන හා වැඩිදියුණු කිරීම් කටයුතු, එසේම පර්යේෂණ කටයුතු සඳහා ද යොදා ගනී. එමගින් රජයට ද අභ්‍යන්තර උපාධිධාරින් වෙනුවෙන් වැය කිරීමට සිදුවන වියදම් අවම කර ගැනීමට මහඟු අවස්ථාවක් වී ඇත.

යම් හෙයකින් මෙසේ දේශන සඳහා පැයකට ගෙවන ගාස්තුව අඩු කිරීමට සිදු වුවහොත්, පාඨමාලාව සාර්ථකව පවත්වාගෙන යාමට බාධාවක් වන අතර, එය ආයතනයට මෙන්ම රජයට ද ඉමහත් පාඩුවක් වනු නිසැකය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හා කරන ලද සාකච්ඡාවේදී තීරණය වූ පරිදි මෙම "පැයක රේටය" වැඩි කිරීම සඳහා අනුමැතිය ඉල්ලා යවා ඇත.

**3. මූල්‍ය සමාලෝචනය**

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 5,650,218ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 9,569,010ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 91,802,000ක් වූ රජයේ ප්‍රදාන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 97,452,218ක් දක්වා වර්ධනය වී ඇත. ඉකුත් වර්ෂයේ දී රු. 83,102,728ක් වූ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන හේතුවෙන් ඌනතාවය රු. 73,533,724ක අතිරික්තයක් බවට පත්විය. සමාලෝචිත සඳහා රජයේ රු. 23,918,500ක වර්ධනයක් ඇතිවීම සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු. 8,699,272කින් වැඩිවීම හා ආදායම රු. 31,579,250කින් වර්ධනය වීම බලපා තිබිණි.

*පිළිතුරු*

සටහන් කර ගතිමි.

**4. මෙහෙයුම් සමලෝචනය**

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) පරිවාස කථිකාචාර්යවරයකු 2005 දෙසැම්බර් 31 දින සේවය හැර ගොස් තිබුණු අතර, බැඳුම්කර වටිනාකම රු. 798,589ක් ආයතනයට අයවීමට තිබුනි. 2006 නොවැම්බර් 16 දින සිට අවස්ථා 03කදී නීතිපතිවරයා විසින් තොරතුරු විමසා ඇතත්, එම තොරතුරු නොසැපයීම හේතුවෙන් නීතිමය කටයුතු අඩාල වී තිබුණි. මෙම මුදල් අර්ථසාධක අරමුදලින් අය කර ගැනීම සඳහා ද කටයුතු කර නොතිබුණි.

*පිළිතුරු*

මෙම නිරීක්ෂණය සම්බන්ධයෙන් එකග විය නොහැකිය. පරිවාස කථිකාචාර්යවරයකු වන රුක්මන් සේනානායක මහතා ආයතනයට ගෙවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 798,588.54ක මුදලක් වන අතර, එය අයකර ගැනීම සඳහා ඔහු සේවය අතහැර ගියාද නොඑසේ නම් ඔහු විසින් ඊමේල් පණිවුඩයක් මගින් කර ඇති ඉල්ලා අස්වීම පිළිගන්නේ ද යන්න පාලක සභාව මගින් තීරණය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දන්වා ඇති අතර, සිහිකැඳවීම්ද කර ඇත. මේ වන තෙක් එම තීරණය ලබා දී නොමැත. මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මගින් ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් විමසීම් කර ඇත.

(ආ) කථිකාචාර්යවරයකු 2004 ඔක්තෝබර් 01 දින සේවය හැර ගොස් තිබුණු අතර, අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 1,311,691ක් විය. 2006 ඔක්තෝබර් 10 දිනැතිව මෙම බැඳුම්කර වටිනාකම ගෙවන ලෙද ආචාර්යවරයාට දැනුම් දී ඇතත් පරීක්ෂණ දිනය වන විටත් අදාළ ගෙවීම් සිදු කර නොතිබුණු අතර, ආචාර්යවරයාට එරෙහිව නීතිමය පියවර ගැනීමට ආයතනයට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

*පිළිතුරු*

ආර්. කේ. රාජපක්ෂ නමැති කථිකාචාර්යවරයා නියමිත බැඳුම්කර වටිනාකම ආයතනය වෙත නොගෙවීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගෙන ඇති අතර, අදාළ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලැබේ.

(ඇ) ආචාර්යවරයකු 2004 නොවැම්බර් 01 දින සේවය හැර ගොස් තිබුණු අතර, අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 3,440,576ක් විය. ආචාර්යවරයාගේ වර්තමාන ලිපිනය සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නීතිමය පියවර ගැනීම සඳහා 2005 අගෝස්තු 31 නීතිපතිවරයා වෙත යොමු කර ඇතත්, වසර 8ක් ගත වී තිබුණු නමුත්, ආයතනය විසින් නීතිපතිවරයාගේ විමසීමක් ද කර නොතිබුණි.

*පිළිතුරු*

එස්. පී. පතිදරන් මහතා අවසන් වරට ලබා දී තිබූ ලිපිනය නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා ඇති නමුත්, ඔහු මේ වන විට එහි පදිංචිය හැරගොස් ඇති බව වාර්තා වී ඇත. මේ වන විට පදිංචි ස්ථානයේ ලිපිනයක් සොයා ගැනීමට නොහැකි වී ඇති අතර, ලිපිනය සොයා ගැනීමට කටයුතු කරගෙනු යනු ලැබේ. කෙසේ වුවද මෙම කාරණය සම්බන්ධයෙන් මේ වන තෙක් නීතිපති දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය කටයුතු කරගෙන යන අතර පතිදරන් මහතා වෙනුවෙන් ඇප බැඳුම්කරවලට අත්සන්කරනු ලැබූ ඇපකරුවන් වෙත නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව මගින් කටයුතු කරගෙන යනු ලැබේ.

(ඈ) කථිකාචාර්යවරයෙකු 2004 ජනවාරි 01 දින සේවය හැර ගොස් තිබුණ අතර අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 3,373,722ක් විය. බැඳුම්කර කඩ කිරීමෙන් වසර 2 1/2කට පසුව එනම් 2006 මැයි මස 22 දින ආයතනයට අයවිය යුතු බැඳුම්කර මුදල් ගෙවන ලෙස ආචාර්යවරයාට දැනුම් දී තිබුණ ද, බැඳුම්කර මුදල් අයවී නොතිබුණි. කොළඹ දිසා අධිකරණයේ පවරන ලද නඩුව සමතයකට පත් ව ආචාර්යවරයාගෙන් අයවිය යුතු මුදල 2013 සැප්තැම්බර් 22 දින රු. 2,000,000ක් හා 2014 මාර්තු 22 දින රු. 1,370,772ක් ගෙවීමට එකඟ වූ බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා එවා තිබුණි.

*පිළිතුරු*

මෙම නිරීක්ෂණය කෙරෙහි එකඟ විය නොහැකිය. මෙම ආචාර්යවරයා සම්බන්ධයෙන් නීතිපති පියවර ගෙන ඇති අතර කොළඹ දිසා අධිකරණයේ අංක DMR0984k109 දරන නඩුව ඔහුට එරෙහිව පවරා තිබුණ අතර එම නඩුව 01.09.2013 දින වන විට සමතයකට පත්ව ඇත. එහි සඳහන් සමත කොන්දේසි අනුව පී. ගුණරත්න මහතාගෙන් අයවිය යුතු රු. 3,370,772.36 වන මුදල 22.09.2013 දිනට රු. 2,000,000ක් ද 22.09.2014 දිනට රු. 1,370,772.36 වශයෙන් ගෙවා නිම කිරීමට එකඟතාව පළ කර ඇත.

කෙසේ වුවද නිරීක්ෂණයේ බැඳුම්කර වටිනාකම වශයෙන් සඳහන් කර ඇති රු. 3,373,722 වන මුදල නිවැරදි නොවන අතර එය රු. 3,370,772.36 ලෙස නිවැරදි විය යුතු වේ.

තවද ඉහත සියලුම ආචාර්යවරුන්ට අදාළ අ. අ. නිදහස් කිරීමේ සියළුම ලිපිලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කොට ඇත.

4.2 අරමුදල් ඌන උපයෝජනය

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා රජය විසින් ජපන් සහයෝගිතා අරමුදල් වලින් උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (Advance Digital Media Technology Center) හා ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ව්‍යාපෘතිය (International Development Research Center) වෙත ලබා දී තිබූ රු. 4,197,538ක අරමුදල් වසර තුනකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබාගෙන තිබුණි.

*පිළිතුරු*

අනිකුත් ව්‍යාපෘති ශේෂයෙන් අදාළ සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ මත සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අදාළ මුදල් වැය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

5. **ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

5.1 සංයුක්ත සැලැස්ම

රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 උපඡේදය ප්‍රකාරව 2011, 2015 කාල පරිච්ඡේදයට පිළියෙළ කර තිබුණු සංයුක්ත සැලැස්මේ, ආයතනයේ වත්කම්වල, වර්තමාන තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්, ආයතන සතු ශක්තීන්, පරමාර්ථ හා ඒවා සම්බන්ධයෙන් පවතින් දුර්වලතා හා බාධාවන් විශ්ලේෂණාත්මකව හඳුනා ගැනීම සඳහා සකස් කළ (SWOT Analysis) ප්‍රකාශනයක් හා ආසන්න වර්ෂ තුන සඳහා මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනයක් දක්වා නොතිබුණි.

*පිළිතුරු*

ආයතනය මගින් දැනට පිළියෙල කරනු ලබන සංයුක්ත සැලැස්ම අදාළ නීතිරීතිවලට අනුකූලව පිළියෙල කිරීමට කටයුතු කරමි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ, ඒ ඒ කාර්ය සඳහා වූ කාල රාමුව, අපේක්ෂිත අරමුණු හා වගකීම දරනු ලබන පුද්ගලයින් වෙනම හඳුනාගත හැකි වන පරිදි ඇතුළත් කර නොතිබුණි.

*පිළිතුරු*

ආයතනය විසින් 2014 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී සැලැස්ම ඒ ඒ කාර්ය සඳහා වූ කාලරාමුව, අපේක්ෂිත අරමුණු හා වගකීම දරනු ලබන පුද්ගලයින් වෙන වෙනම හඳුනාගත හැකි වන පරිදි පිළියෙල කර ඇත.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු. 5,500ක ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එම වාර්තාව 2013 පෙබරවාරි 14 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

*පිළිතුරු*

ආයතනය විසින් 2012 වර්ෂය සඳහා සකස් කර ඇති විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදන පූර්ව කටයුතු ආරම්භක දිනය, අවසාන දිනය සහ ප්‍රසම්පාදනය භාරදෙන දිනය, අවසාන කරන දිනය යන කරුණු ඇතුළත්ව ඇත. ඒ ප්‍රසම්පාදන කාර්යයන්හි දින වකවානු ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට සහ අනුමත අයවැයට සමගාමීව, 2014 වර්ෂය සිට පිළියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ.

5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ආයතනයේ 2011 වාර්ෂික වාර්තාව 2013 ජූලි 23 වන විටත් සභාගත කර නොතිබුණි. එම වාර්තාව 2013 පෙබරවාරි 14 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

*පිළිතුරු*

2013.02.14 දින 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත මෙම ක්‍රියාවලිය අවසාන වූ පසු පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු යොදමි.

5.4 පරිගණක අධ්‍යයන ආයතනය තුළ සීමිත සමාගමක් පිහිටුවීම

පරිගණක අධ්‍යයන ආයතනය පිහිට වූ 2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ආයතන නියමාවලියේ 18(iv) වගන්තිය අනුව පරිගණක මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා බලතල පැවරී තිබුණි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 වගන්තියට අනුකූල නොවන පරිදි එයට පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ දක්වා ඇති සමාන අරමුණු හා කාර්යයන් ඉටු කිරීම සඳහා පරිගණක සේවා මධ්‍යස්ථානයක් සෘජුවම තරගකාරී ස්වරූපයක් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව කළ යුතු වුවත්, කළමනාකරණ මණ්ඩලය තීරණය පරිදි සමාගම ආඥාපනත යටතේ සීමාසහිත තීක්ෂණ පෞද්ගලික සමාගමක් පිහිටුවීම නීතියට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

*පිළිතුරු*

ජාත්‍යන්තර තලයේ විශ්වවිද්‍යාල විසින් තම පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය කිරීමේලා (Commercialization) අනුගමනය කරනු ලබන න්‍යාය උපයෝගී කරගනිමින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ නිර්මාතෘ විද්‍යාජෝති මහාචාර්ය වී. කේ. සමරනායක මහතාගේ උපදෙස් මත මෙම සීමිත තීක්ෂණ සමාගම පිහිටුවීමට කළමනාකරණ මණ්ඩලය මගින් අවසර දෙන ලදී.

ඒ අනුව 2006 ජනවාරි 05 දින පැවති 40 වන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ [Memo No. : UCSC/BOM/40/12 (i)] අනුව තීරණය කරනු ලැබූයේ පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC) සමාගමක් ලෙස පිහිටුවීම සොයා බැලීමත් ඒ කාර්යය සඳහා උපදේශකවරයෙකු (Consultant) සහ නීතිමය අවශ්‍යතාවයන් සපුරාලීමට සමාගම් ලේකම්වරයෙකු පත් කරන ලෙසයි.

එයින් පසු 2006 වර්ෂයේ මාර්තු මස 2 වැනි දින පැවැති 42 වන කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද [Memo No. : UCSC/ BOM/42/10(d)] ලේඛනය අනුව ජනවාරි 05 වැනි දින පැවති රැස්වීමේ තීරණය අනුව පත්කල උපදේශකවරයා විසින් අදාල වාර්තාව ඉදිරිපත් කර තිබූ බවයි. එසේම එකී වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව කළමනාකරණ මණ්ඩලයට උපදෙස් දී ඇත්තේ සමාගම පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසයි.

කළමනාකරණ මණ්ඩලය විසින් මෙහිදී මොරටුව විශ්වවිද්‍යාලය විසින් පිහිටුවා ඇති සමාගම පූර්වාදර්ශයක් ලෙස සලකන ලද අතර එහි නීතිමය උපදේශකවරයාගේ ද සහාය ලබා ගන්නා ලදී.

එසේම ජාත්‍යන්තර තලයේ විශ්වවිද්‍යාල විසින් තම පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය කිරීමේදී අනුගමනය කරනු ලබන උපායමාර්ගය ලෙස මෙවැනි සමාගමක් පිහිටුවීම කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගන්නා ලදී.

මෙම තීක්ෂණ සමාගම පරිගණක සේවා මධ්‍යස්ථානය සමග කිසිදු අයුරකින් තරගකාරී ස්වරූපයක් නොගනී. එනම් මෙම සමාගම උපදේශන සේවා සපයනු ලබන්නේ ජාත්‍යන්තර අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා පමණක් වීමයි. එසේම ලෝක බැංකුව අරමුදල් මත ක්‍රියාත්මක වන ICTA නියෝජිත ආයතනයේ නිර්දේශය මත (Recommendation) සමාගමට ලැබෙන කොන්ත්‍රාත් මත ද උපදේශන සේවා සපයයි.

විගණන නිර්දේශය මත අදාළ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි.

**6.පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු ය.

(අ) ස්ථාවර වත්කම්

*පිළිතුරු*

සටහන කර ගතිමි

(ආ) ගිණුම් තැබීම

*පිළිතුරු*

සටහන් කර ගතිමි

(ඇ) ව්‍යාපෘති අරමුදල්

*පිළිතුරු*

සටහන් කර ගතිමි

(ඈ) මිලදී ගැනීම්

*පිළිතුරු*

සටහන් කර ගතිමි.

ස්තුතියි !

මෙයට, විශ්වාසී.

මහාචාර්ය ජී. එන්. වික්‍රමනායක,
අධ්‍යක්ෂ.

03-556

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජුනි 26 වන දින පැවති තම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ජී. ඩබ්. එස්. සමරසිංහ මහත්මිය විසින් ලියා සහතික කළ 2008.08.25 දිනැති අංක 8219 දරන උකස් බැඳුම්කරය මතද, 2005.05.02 දිනැති අංක 7337 දරන උකස් බැඳුම්කරය මතද, 2006.08.28 දිනැති අංක 7655 දරන උකස් බැඳුම්කරය මතද සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් ලියා සහතික කළ 2012.05.29 දිනැති අංක 5586 දරන උකස් බැඳුම්කරය මගින් අය වීමට ඇති මුදල් කලුහෙට්ටිආරච්චිගේ ප්‍රදීප් ධම්මික පෙරේරා සහ උඩුනුවරගේ වජිරා ප්‍රියංගනි පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් අංක 8219 7338 7655 සහ 5586 දරන එකී බැඳුම්කර මත 2012.11.16 වන දිනට එකී බැඳුම්කර මත රුපියල් මිලියන පනයි තුන්සිය පහලොස්දහස් හතලිස් අටයි ශත අනූතුනක මුදලක් (රු.53,15,048.93) 2012.11.16 වන දින සිට මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසුව සහ වෙනත් විකුණුම් පිරිවැයක් සහ අනෙකුත් ගාස්තු ද සමග රුපියල් හතරමිලියන දෙසිය තිස්හතර දහස් තිස් තුනයි ශත පනස්පහක් (රු.42,34,033.55) සහ රුපියල් මිලියන දෙකයි තුන්සිය අසූහත්දහස් තිස් හයයි ශත පනස් හතරක් (රු.23,87,036.54) ක මුදල 2012.11.17 වන දින සිට වාර්ෂිකව 24% බැගින් පොලිය ද සමග සහ රුපියල් අටලක්ෂ හැත්තෑදහස් හාරසිය තිස්හතයි ශත හතලිස්නවයක මුදලක් 2012.11.17 වන දින සිට 16.5% බැගින් පොලිය ද සමග සහ රුපියල් නවලක්ෂ හැත්තෑහයදහස් පන්සිය

පනස්නවයයි ශත පනස්දෙකක මුදලක් (රු. 9,76,559.52) 2013.12.09 වන දින සිට විකිණීමේ දිනය තෙක් වාර්ෂිකව 24% බැගින් පොලිය ද සමග අය කර ගැනීම සඳහා එකී උකස් බැඳුම්කර මගින් එකී බැංකුව වෙත උකස් කර දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්වින් පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ අධිකාරී පත්තුවේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මුල්ලේරියාවේ පිහිටි කුමාර මාවතේ වරිපනම් අංක 30 ඒ දරන දෙවටගහවත්ත හෙවත් කොස්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සකස් කරන ලද 1994.04.12 දිනැති අංක 2901 දරන පිඹුරේ නිරූපිත ලොට් බී වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාවන් සහ සියලු දේ ද සමග එකී ලොට් බී දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ලොට් ඒ සහ සී ද, නැගෙනහිරට : අනෝමා ගුණසේකරගේ ඉඩම ද, දකුණට : ලීලාවතී අබේවර්ධනගේ ඉඩම ද සහ බටහිරට : ජේ. එම්. සුදුබණ්ඩාගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් නවයක (අ. 0, රූ. 0, පර් 9) (හෙක්ටයාර් 0.0228) ප්‍රමාණයකින් යුත් සම්පූර්ණ ඉඩම් කොටස වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්/7139 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එස්. එච්. පීරිස් විසින් සකස් කළ 1984.05.24 දිනැති අංක 5227 දරන පිඹුරේ නිරූපිත ජී.2සී වශයෙන් ලකුණු කළ කැබැල්ල ද, බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සකස් කරන ලද 1994.04.12 දිනැති අංක 2901 පිඹුරේ නිරූපිත ලොට් සී දරන කැබැල්ල ද මතින් වන මාර්ග අයිතිය සහ අනෙකුත් පොදු අයිතීන් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
කොළඹ - දකුණ.

මහජන බැංකුව - කළාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය 01)
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

03-534

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.09.16 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එඩ්මන් කුලරත්න මහතා විසින් සහතික කරන ලද 2006.01.25 දිනැති අංක 9943 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් පර්සි වඩුගෙදර මහතා විසින් සහතික කරන ලද 2011.09.26 දිනැති අංක 9569 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.08.11 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැට දෙලක්ෂ හැත්තෑ හතර දහස් හත්සිය හතලිස් දෙකයි ශත දහහතරක (රු. 6,274,742.14) මුදල සමග රුපියල් පනස් ලක්ෂ පනස් නව දහස් අටසිය දහයයි ශත හතලිස් හයක (රු. 5,059,810.46) මුදල මත වසරකට සියයට දහයයි දශම දෙකයි හතක් (10.27%) බැගින් පොළියක් 2014.08.12 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, බිංගිරිය, තල්ගහපිටිය, ඒ. පී. එස්. ෆාර්ම් නමැති ලිපිනයේ හෙට්ටිආරච්චිගේ අමිල ප්‍රදීප් සාගර පෙරේරා මහතා හෙවත් හෙට්ටිආරච්චිලාගේ අමිල ප්‍රදීප් සාගර පෙරේරා මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. 2006.01.25 දිනැති 9943 අංක දරන උකස් බැඳුම්කරය හා 2011.09.26 දිනැති 9569 අංක දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැට දෙලක්ෂ හැත්තෑ හතර දහස් හත්සිය හතලිස් දෙකයි ශත දහහතරක (රු. 6,274,742.14) මුදල සමග 2014.08.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුරුණෑගල, මල්කඩුවාව, තල්ගහපිටිය මාවතේ, අංක 33 හි පදිංචි වෙන්දේසිකාර එච්. ඩබ්. අසෝක ජයලාල් මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, බිංගිරිය ශාඛාවේ ශාඛා කළමනාකරු හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ,කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ කිනියම කෝරළයේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්ගහපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බිංගිරිය හි පිහිටි පරණ වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩී. පෙරේරා විසින් සාදන ලද 1989.10.07 දිනැති අංක 263 දරන පිඹුරේ විස්තර කළ ලොට් 03,04 ලෙස ලකුණු කළ බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 03,04 හි මායිම් නම් උතුරට : එකී අංක 263 දරන පිඹුරේ ලොට් 02 ද, නැගෙනහිරට : ලොට් 05 දරන පාර සහ එරික් සූරියසේන හිමිකම් කියන ඉඩම ද, දකුණට : එරික් සූරියසේන හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : ඇන්තනී ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද, මායිම්ව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තුනයි දශම දෙකක (අ. 01, රූ, 02, පර්. 3.2) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 125/236 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. එන්. ආර්. රත්නකාන්ති මිය,
කළමනාකාරිණී.

2015 පෙබරවාරි මස 02 වනි දින,
ලංකා බැංකුව,
බිංගිරිය.

03-594

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1260395
පැතිගමගේ කුරුවිටගේ ඩිල්ෂාන් බුද්ධික පෙරේරා

2014 අගෝස්තු මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2012 ජූනි මස 28 වැනි දින සහතික කරන ලද අංක 1880 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැතිගමගේ කුරුවිටගේ ඩිල්ෂාන් බුද්ධික පෙරේරා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි හතලිස් හත්ලක්ෂ විසිහයදහස් දෙසිය පනස් අටයි ශත හැටතුනක (රු. 14,726,258.63) මුදලක් 2014 ජූලි 17 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි හතලිස්හත් ලක්ෂ විසිහයදහස් දෙසිය පනස් අටයි ශත හැටතුනක (රු. 14,726,258.63) මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජූලි මස 18 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 13,714,329.83 ක මුදල මත 16% ක වැඩිදුර පොළියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 1880 බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 182 දරන ස්ථානයේ 3 වැනි මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබද්දේ පානදුර නගර සභා සීමාව තුළ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 683 ඒ වලපොළ පට්ටිය ග්‍රාම නිලධාරී වසමේ වලපොල පට්ටියෙහි පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් 2011 දෙසැම්බර් මස 16 වැනි දින මැන සාදන ලද අංක 7687 දරන පිඹුරේ ලොට් ඒ 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : එල්. සී. ද මැල් මහත්මියට අයිති කැටකැලගහවත්ත ද නැගෙනහිරට : අංක 2664 දරන පිඹුරේ ලොට් බී ද, දකුණට : ඩයස් පෙදෙස ද, සහ බස්නාහිරට : ආනන්ද වීරසූරියට අයත් කහටගහවත්ත පුද්ගලික පාරෙන් ද, මායිම් වූ එකී අංක 7687 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඅටයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 28.75) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත සඳහන් වලපොළ පට්ටියෙහි පිහිටි වරිපනම් අංක 17 දරන කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල් ද සිල්වා විසින් 1982 පෙබරවාරි මස 10 වැනි දින මැන සාදන ලද අංක 2664 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ඉහත සඳහන් අංක 2664 දරන පිඹුරේ ලොට් බී ද, ආනන්ද වීරසූරියට අයිති කහටගහවත්ත ද, එල්. සී. ද මැල් මහත්මියට අයිති කැටකැලගහවත්ත ද, නැගෙනහිරට : අංක 2664 දරන පිඹුරේ ලොට් බී ද, දකුණට : ඩයස් පෙදෙස ද, සහ බස්නාහිරට : ආනන්ද වීරසූරියට අයත් කහටගහවත්ත සහ පුද්ගලික පාරෙන් ද මායිම් වූ එකී අංක 2664 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි අටයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 28.75) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරු එෆ් 602/13 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

2014 සැප්තැම්බර් මස 1 වැනි දින.

03-589

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.